කාන්තාවන් සම්බන්ධ පුවත් වාර්තාකරණයේදී, ඔවුන්ව ලිංගික වස්තූන් ලෙසින් හැඟවුම්කරණය කිරීම, මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීමක් නොවන්නේද යන්න Ethics Eye අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. නමුත් ඇතැම් මාධ්‍ය ඔස්සේ තවමත් එම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය සිදුවීම කණගාටුවට කරුණකි.

උදාහරණයක් වශයෙන් ජනවාරි 7, 2022 දින ලංකාදීප සහ දිවයින පුවත්පත් වල, පිළිවෙලින් "බ්‍රිතාන්‍ය තරුණියට අතවර කළැයි මීගමු තරුණයා උසාවියේදී පිළිගනී" සහ "මීගමුව හෝටලයකදී බ්‍රිතාන්‍ය යුවතියට අතවර කළ සැකකරු වරද පිළිගනියි" යන සිරස්තල යටතේ පළ වූ පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක.මෙම ලිපි දෙකෙහිම අන්තර්ගතය තුළ, මෙම ලිංගික අපරාධයට මුහුන පෑ බ්‍රිතාන්‍ය ජාතික කාන්තාව "රූමත්" ලෙසින් හඳුන්වමින් විස්තර දක්වා තිබුණි.

ඔබ සිතනා ලෙසට,

1) ලිංගික අපරාධ සිදුවීමක පසුතලයේ, "රූමත්" වැනි විශේෂණ යොදාගැනීම ඔස්සේ, කාන්තාවක ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය වීමක් සිදු නොවන්නේ ද?

2) එය, ඇයව ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව කොන් කිරීමක් සහ ඒකාකෘතික කිරීමක් නොවේ ද?

ඔබේ අදහස?